# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2026 මැයි 28** |

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා වූ මාස 48ක විස්තීර්ණ ණය පහසුකම යටතේ සිදු කළ පස්වන හා හයවන ඒකාබද්ධ සමාලෝචන සම්පූර්ණ කරන ලද අතර, එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණවලට සහාය දැක්වීම සඳහා විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 508ක (එ.ජ. ඩොලර් මිලියන 695ක පමණ) මූල්‍යන පහසුකමක් වෙත ක්ෂණික ප්‍රවේශය ලබා දෙන ලදී. මෙම වාරික ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ශ්‍රී ලංකාවට ලැබෙන හයවන හා හත්වන වාරික වේ. ඒ අනුව, ජා.මූ. අරමුදලෙන් මේ දක්වා ලබා දී ඇති මුළු මූල්‍යන සහාය වි.ගැ.හි. බිලියන 1.778ක් (එ.ජ. ඩොලර් බිලියන 2.4ක් පමණ) දක්වා ඉහළ යනු ඇත. ජා.මූ. අරමුදල විසින් 2026 වසරේ මැයි 27 වන දින පහත දැක්වෙන මාධ්‍ය නිවේදනය නිකුත් කරන ලද අතර, එයට පහත සබැඳියෙන් ප්‍රවේශ විය හැකිය.

https://www.imf.org/en/news/articles/2026/05/27/pr26172-sri-lanka-imf-completes-combined-5th-and-6th-reviews-under-eff

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය ශ්‍රී ලංකාව සඳහා වූ විස්තීර්ණ ණය පහසුකම යටතේ සිදු කළ පස්වන සහ හයවන ඒකාබද්ධ සමාලෝචන සම්පූර්ණ කරයි**

- *ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා වූ විස්තීර්ණ ණය පහසුකම යටතේ පස්වන සහ හයවන ඒකාබද්ධ සමාලෝචන සම්පූර්ණ කරන ලද අතර, එමගින් ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණවලට සහාය වීම සඳහා වි.ගැ.හි. මිලියන 508ක (එ.ජ. ඩොලර් මිලියන 695ක පමණ) මූල්‍යන පහසුකමක් සඳහා ශ්‍රී ලංකාවට ක්ෂණික ප්‍රවේශයක් ලබා දෙන ලදී.*

- *විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ කාර්ය සාධනය සාමාන්‍යයෙන් ශක්තිමත් මට්ටමක පවතී. ඉන්ධන සහ පිරිවැය ආවරණය කෙරෙන විදුලි මිලකරණය යළිත් ස්ථාපනය කිරීම සම්බන්ධ පූර්ව ක්‍රියාමාර්ග අවශ්‍යතා සපුරා ඇත. නව විදේශීය ගෙවීම් හිඟයන් ඇති වීමට ඉඩ නොතැබීම සහ ආනයන සීමා අළුතින් පැනවීම සහ තීව්‍ර නොකිරීම පිළිබඳ අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක සපුරා නොමැත. 2025 වසරේ දෙසැම්බර් මස අවසානය සඳහා වූ සියලුම ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සපුරා ඇත. බොහෝ ව්‍යුහාත්මක මිනුම් දඬු සපුරා ගෙන හෝ ප්‍රමාදයක් සහිතව ක්‍රියාත්මක කර ඇත.*

- *මැද පෙරදිග යුද්ධය සහ දිට්වා සුළි කුණාටුවේ පසු බලපෑම් හේතුවෙන් ආර්ථිකයට අහිතකර බලපෑම් එල්ල වීමේ අවදානමක් පැවතිය ද ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ  දුෂ්කරතා මධ්‍යයේ ළඟාකර ගත් ජයග්‍රහණ හේතුවෙන්, ආර්ථිකයට සහාය වීමට සහ අවදානමට ලක්විය හැකි පිරිස්වලට රැකවරණය සැලසීමට අවශ්‍ය කඩිනම් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හැකි වී ඇත.*

**වොෂින්ටන්, ඩී.සී:** ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් මාස 48ක විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වන ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනේ පස්වන සහ හයවන ඒකාබද්ධ සමාලෝචන සම්පූර්ණ කරන ලදී. ඒකාබද්ධ සමාලෝචන සම්පූර්ණ කිරීම මගින් වි.ගැ.හි. මිලියන 508ක (එ.ජ. ඩොලර්

මිලියන 695ක පමණ) මූල්‍යන පහසුකමක් හිමි වන අතර, ඒ අනුව මෙම පහසුකම යටතේ වූ මුළු ලැබීම් වි.ගැ.හි. බිලියන 1.778ක් (එ.ජ.ඩොලර් බිලියන 2.4ක් පමණ) වේ.[1]

2023 වසරේ මාර්තු 20 වන දින, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා, වි.ගැ.හි බිලියන 2.286ක (හිමිකමින් සියයට 395ක හෝ දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 3ක පමණ) විස්තීර්ණ ණය පහසුකමක් අනුමත කෙරුණි ([මාධ්‍ය නිවේදන අංක. 23/79]). එම වැඩසටහන, (i) අවදානමට ලක්වූවන් ආරක්ෂා කරන අතර ම රාජ්‍ය මූල්‍ය සහ ණය තිරසාර බව යළි ස්ථාපනය කිරීම, (ii) මිල ස්ථායීතාව සහ මූල්‍ය අංශයේ ස්ථායීතාව ආරක්ෂා කිරීම, (iii) බාහිර ස්වාරක්ෂක නැවත ගොඩනැගීම, (iv) දූෂණ අවදානම් අවම කිරීම හා යහ පාලනය ශක්තිමත් කිරීම සහ (v) වර්ධනය ඉලක්ක කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම හරහා සාර්ව ආර්ථික ස්ථායීතාව දිගු කල් පවතින ලෙස නැවත ඇති කිරීම සඳහා වූ ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණ වැඩසටහනට සහාය වෙයි.

විධායක මණ්ඩලයේ සාකච්ඡාවෙන් අනතුරුව, නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ සහ වැඩබලන ප්‍රධානී කෙන්ජී ඔකමුරා මහතා පහත ප්‍රකාශය නිකුත් කළේය.

“අභියෝගාත්මක තත්ත්ව මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාව විසින් විස්තීර්ණ ණය පහසුකම යටතේ වැඩසටහන අඛණ්ඩව ශක්තිමත් ලෙස ක්‍රියාත්මක කර ඇත. ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනෙන් ලැබුණු ප්‍රතිලාභ ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ආරක්ෂා කර ගැනීමට උපකාරී වූ අතර දිට්වා සුළි කුණාටුවට සහ මැද පෙරදිග යුද්ධයට ප්‍රතිචාර දැක්වීමට අවකාශය සැලසීය. කෙසේ වෙතත්, ඉහත දක්වා ඇති දෙවැන්න ශ්‍රී ලංකාවේ ඉදිරි ආර්ථික දැක්ම කෙරෙහි සැලකිය යුතු ලෙස අහිතකර බලපෑම් එල්ල කර ඇති අතර, ආර්ථිකයට සෘණාත්මක ලෙස බලපෑ හැකි අවදානම් ඉහළ නංවයි. 2026 වසරේ ආර්ථික වර්ධනය 3%ක් දක්වා මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කෙරේ. බනිජ තෙල් මිල ඉහළ යෑම හේතුවෙන් උද්ධමනය ඉහළ යෑමට සහ විදේශ ජංගම ගිණුම කෙරෙහි අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති අතර, සංචාරක ඉපැයීම් පහළ යෑම ද විදේශ ජංගම ගිණුම කෙරෙහි සෘණාත්මක බලපෑම් එල්ල කරනු ඇත. යුද ගැටුම්වල තීව්‍රතාව සහ ගැටුම් පවතින කාල සීමාව පිළිබඳව පවතින අවිනිශ්චිතතාව ඉදිරි ආර්ථික දැක්ම සම්බන්ධ අවදානම් තවදුරටත් වැඩි කරයි.

“කම්පනවලට ප්‍රතිචාර වශයෙන් 2026 වසරේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සුදුසු වේ. රජය තාවකාලික සහන පැකේජයක් ක්‍රියාත්මක කරන අතර දිට්වා සුළි කුණාටුවෙන් පසු යථා තත්ත්වයට පත් වීමට සහ යළි ගොඩනැගීමට සහාය වීම සඳහා අමතර වියදම් වෙන් කරමින් සිටියි. 2027 වසරේ සිට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක ප්‍රාථමික ශේෂ ඉලක්කයට නැවත ළඟා වීමට මෙන්ම ප්‍රාථමික වියදම් උපරිම සීමාවට අනුකූල වීමට බලධාරීන් අවශ්‍ය ලෙස කැපවී සිටියි.

“වැඩසටහන් කාර්ය සාධනය පොදුවේ ගත් විට ශක්තිමත්ව පැවතුන ද, රාජ්‍ය මූල්‍ය හා ආයෝජන කළමනාකරණ සහ විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කිරීම සඳහා ප්‍රයත්න දැරීමට අවශ්‍ය වේ. බදු ක්‍රමය වඩාත් කාර්යක්ෂම කිරීම සහ වර්ධනය වැඩි දියුණු කිරීම සඳහා රජයේ ආදායම් රැස් කිරීම දිගට ම සිදුකිරීම අත්‍යවශ්‍ය වන අතර, එය මූලිකව මැදි කාලීන ආදායම් රැස් කිරීමේ උපායමාර්ගයක් සකස් කිරීම හරහා සිදු විය යුතුය. ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්පූර්ණ කිරීමට ආසන්න වන නමුත්, ණය තිරසාර බව පිළිබඳ අවදානම් ඉහළ මට්ටමක පවතී.

"මිල ස්ථායීතාවට ප්‍රමුඛතාව ලබා දෙමින් මුදල් ප්‍රතිපත්තිය පවත්වාගෙන යා යුතුය. විනිමය අනුපාතිකයේ නම්‍යශීලීතාව ඉහළ නැංවීම සහ ගෙවුම් තුලන ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ඉවත් කිරීම, විදේශීය අංශයේ ස්වාරක්ෂක සහ ඔරොත්තුදීමේ හැකියාව යළි ගොඩනගා ගැනීම සඳහා තීරණාත්මක වේ.

“ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමට සහ ආර්ථික වර්ධන විභවතාව ඉහළ නැංවීම සඳහා ක්‍රමානුකූලව සකස් කරන ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මෙන්ම නව්‍යකරණය කරන ලද රාජ්‍ය යටිතල පහසුකම් ද අවශ්‍ය වේ.”

[1] විධායක මණ්ඩලයේ අනුමැතිය ලැබුණු දිනයට අදාළ වි.ගැ.හි. ඒකකයක් සඳහා වන එ.ජ. ඩොලර් වෙළඳපොළ අනුපාතික භාවිතයෙන් වි.ගැ.හි. අගයන් පරිවර්තනය කර ඇත.

## ශ්‍රී ලංකාව: තෝරාගත් ආර්ථික දර්ශක 2025-2028

| | 2025 | 2026 | 2027 | 2028 |
|---|---|---|---|---|
| | ප්‍රකාශිත | පුරෝකථන | | |
| **දළ දේශීය නිෂ්පාදිතය සහ උද්ධමනය** (ප්‍රතිශතයක් ලෙස) | | | | |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතය | 5.0 | 3.0 | 3.2 | 3.1 |
| උද්ධමනය (සාමාන්‍යය) 1/ | -0.5 | 5.0 | 5.3 | 5.0 |
| උද්ධමනය (කාල පරිච්ඡේදය අවසානයේ දී) 1/ | 2.1 | 6.1 | 5.0 | 5.0 |
| ද.දේ.නි. අවධමනකයේ වර්ධනය | 3.7 | 6.2 | 5.2 | 5.0 |
| නාමික ද.දේ.නි.යේ වර්ධනය | 8.8 | 9.4 | 8.5 | 8.2 |
| **ඉතුරුම් හා ආයෝජන** (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) | | | | |
| ජාතික ඉතිරිකිරීම් 2/ | 31.2 | 27.4 | 24.2 | 23.9 |
| රජය | 0.7 | -0.4 | 0.2 | 0.0 |
| පෞද්ගලික | 30.6 | 27.8 | 24.1 | 23.9 |
| ජාතික ආයෝජන | 29.6 | 27.9 | 24.3 | 24.2 |
| රජය | 5.6 | 5.8 | 4.7 | 4.6 |
| පෞද්ගලික | 24.1 | 22.1 | 19.6 | 19.5 |
| ඉතුරුම්-ආයෝජන ශේෂය | 1.6 | -0.5 | -0.1 | -0.3 |
| රජය | -4.9 | -6.3 | -4.6 | -4.6 |
| පෞද්ගලික | 6.5 | 5.8 | 4.5 | 4.4 |
| **රාජ්‍ය මූල්‍ය** (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) | | | | |
| ආදායම් සහ ප්‍රදාන | 16.7 | 15.2 | 15.1 | 15.0 |
| වියදම | 19.0 | 20.3 | 18.7 | 18.8 |
| ප්‍රාථමික ශේෂය | 5.4 | 1.4 | 2.3 | 2.3 |
| මධ්‍යම රජයේ ශේෂය | -2.3 | -5.1 | -3.7 | -3.8 |
| මධ්‍යම රජයේ දළ මූල්‍යන අවශ්‍යතා | 19.0 | 19.8 | 14.4 | 13.7 |
| මධ්‍යම රජයේ ණය | 96.8 | 96.3 | 93.5 | 92.5 |
| රාජ්‍ය ණය 3/ | 101.1 | 100.1 | 96.9 | 95.5 |
| **මුදල් හා ණය** (ප්‍රතිශතය වෙනස්වීම, කාල පරිච්ඡේදය අවසානයට) | | | | |
| සංචිත මුදල් | 16.7 | 9.8 | 8.5 | 8.2 |
| පුළුල් මුදල් | 11.5 | 17.3 | 8.5 | 8.2 |
| දේශීය ණය | 11.3 | 9.8 | 7.1 | 6.2 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 25.2 | 14.5 | 11.8 | 9.3 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය (උද්ධමනය සඳහා ගළපන ලද) | 25.7 | 9.5 | 6.5 | 4.3 |
| මධ්‍යම රජය සහ රාජ්‍ය සංස්ථා වෙත ලබා දුන් ණය | -1.4 | 4.3 | 1.1 | 1.9 |
| **ගෙවුම් තුලනය** (එ.ජ. ඩොලර් මිලියන) | | | | |
| අපනයන | 13,581 | 14,131 | 14,401 | 15,179 |
| ආනයන | -21,480 | -23,095 | -22,748 | -23,987 |
| ජංගම ගිණුම් ශේෂය | 1,719 | -534 | -115 | -302 |
| ජංගම ගිණුම් ශේෂය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) | 1.6 | -0.5 | -0.1 | -0.3 |
| පොලී ගෙවීම් හැර ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) | 2.8 | 1.4 | 1.8 | 1.7 |
| අපනයන අගය වර්ධනය (ප්‍රතිශතය) | 6.3 | 4.0 | 1.9 | 5.4 |
| ආනයන අගය වර්ධනය (ප්‍රතිශතය) | 14.0 | 7.5 | -1.5 | 5.4 |
| **දළ නිල සංචිත** (කාලපරිච්ඡේදය අවසානයේ දී) | | | | |
| එ.ජ.ඩොලර් මිලියන | 6,838 | 8,645 | 11,779 | 13,939 |
| භාණ්ඩ හා සේවා ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 3.1 | 3.9 | 5.1 | 5.7 |
| සංචිත ප්‍රමාණාත්මකභාවය තක්සේරු කිරීමේ (ARA) සංයුක්ත මෙට්‍රික් ප්‍රතිශතයක් ලෙස | 59.4 | 73.6 | 96.9 | 110.8 |
| **චීන මහජන බැංකුව සමඟ වන විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි කොන්දේසි අනුව ගිණුම්ගත කෙරෙන දළ නිල සංචිත** (කාලපරිච්ඡේදය අවසානයේ දී) 4/ | | | | |
| එ.ජ.ඩොලර් මිලියන | 5,395 | 8,645 | 11,779 | 13,939 |
| භාණ්ඩ හා සේවා ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 2.4 | 3.9 | 5.1 | 5.7 |
| සංචිත ප්‍රමාණාත්මකභාවය තක්සේරු කිරීමේ (ARA) සංයුක්ත මෙට්‍රික් ප්‍රතිශතයක් ලෙස | 46.9 | 73.6 | 96.9 | 110.8 |
| **විදේශීය ණය** (රාජ්‍ය සහ පෞද්ගලික) 4/ | | | | |
| එ.ජ.ඩොලර් බිලියන | 54.8 | 56.7 | 58.9 | 60.2 |
| ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | 50.3 | 51.7 | 52.7 | 51.2 |
| **විශේෂිත අයිතම:** | | | | |
| නාමික දළ දේශීය නිෂ්පාදිතය (රුපියල් බිලියන) | 32,751 | 35,835 | 38,891 | 42,089 |
| විනිමය අනුපාතිකය (කාල පරිච්ඡේදය සඳහා සාමාන්‍යය) | 300.9 | ... | ... | ... |
| විනිමය අනුපාතිකය (කාල පරිච්ඡේදය අවසානයේ දී) | 310.0 | ... | ... | ... |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා බලධාරීන් විසින් සපයන ලද දත්ත සහ ජා.මූ. අරමුදලේ කාර්ය මණ්ඩල ඇස්තමේන්තු.
1/ කොළඹ පාරිභෝගික මිල දර්ශකය.
2/ මුදල් පදනම, උපචිත නමුත් නොගෙවූ පොලිය හැර.
3/ මධ්‍යම රජයේ ණය, රාජ්‍ය ඇපකර මත ගනු ලැබූ ණය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය වගකීම් (එනම්, නොපියවූ අරමුදල් ණය සහ ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්) ඇතුළත් වේ. ණය සංඛ්‍යාලේඛන දැනට උපකල්පනය කරන්නේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම 2023 වසර අවසානයේ අවසන් කර ඇති බවයි.
4/ දත්ත පවතින විට, වෙළඳපොළ වටිනාකම මත පදනම්ව.